20/06/2010 - ඉරිදා ලංකාදීප

**තොරතුරු දැන ගැනීම මහජනතාවට ඇති අයිතියකි**

ලෝකය පරිවර්තනය වන අවස්ථාවේ විවිධ යුග පසුකර තිබේ. කෘෂිකාර්මික, කර්මාන්ත හා සේවා වශයෙන් මෙම යුග වෙන්කර ගත හැකිය. මෙම යුගවලදී වැඩි බලයක් හිමිවූයේ ශ්‍රමයටය. ශක්තිය ඇති ශ්‍රමය වගුරවන සේවකයාට ලැබුණේ ඉහල අවස්ථාවකි. කම්කරුවාගේ අයිතිය හා කාර්යක්ෂමභාවය වෙනුවෙන් නීති රීති හා සුබසාධන වැඩ පිලිවෙල සම්පාදනය විය. දැන් උදා වී ඇත්තේ තොරතුරු තාක්ෂණ යුගයයි. තොරතුරු තාක්ෂණ යුගය දැනුම පදනම් කරගත් සමාජයකි. මෙම සමාජ යුගයේ මානව සම්පත හා බුද්ධිය ඉතාමත් වැදගත් සාධකයකි.

මානව සම්පත කළමනාකරණය හා තොරතුරු සම්පාදනය අද ජාත්‍යන්තරයේ ඇති විශාලතම වෙළඳපොළ බවට පත්ව තිබේ. ශ්‍රී ලංකාව ඇතුලු වෙමින් සිටින්නේ මෙම තොරතුරු තාක්ෂණ යුගයටය. විනිවිද පෙනන ස්වභාවය එහි ඇති වැදගත්කමයි. ප්‍රජාතන්ත්‍රවාදයේ දියුණු තත්ත්වයක් වශයෙන් ද එය සැලකිය හැකිය. නිවැරදි තොරතුරු දැනගත්විට එහි ඇත්ත කුමක්ද අරමුණ හා හරය කෙබඳු ද යන්න පැහැදිලි කරගෙන තීන්දුවකට පැමිණෙන්නට මහජනතාවට හැකිවෙයි. ශ්‍රී ලාංකිය ජනතාව දැන් අධ්‍යාපනය හා බුද්ධිය අතින් පොහොසත්ය. විශේෂයෙන් පරිගනක තාක්ෂණය හා තොරතුරු හුවමාරුව සම්බන්ධයෙන් ප්‍රගතියක් දක්වමින් සිටී. ඒ අතරම ප්‍රජාතන්ත්‍රවාදය තව තවත් පුළුල්ව වැඩෙමින් තිබේ. මහජනතාව ද එහි පොහොසත් ලක්ෂණ අපේක්ෂා කරයි. දියුණුවෙමින් පවතින එහි විශිෂ්ඨ අංග මෙරට සමාජයට හඳුන්වා දිය යුතුය.

කාර්මික යුගයේ දී කම්කරුවා සම්බන්ධ පැවති නීති රීති හා සම්ප්‍රදායයන් සේ ම තොරතුරු තාක්ෂණ යුගයේ දී ද මහජනතාවට ඒ සම්බන්ධව නීතිරීති සම්පාදනය කිරීම වැදගත්ය. මහජනතාවට අවශ්‍යවන්නේ පහසුවෙන් තොරතුරු දැනගැනීමටය. ප්‍රජාතන්ත්‍රවාදී පාලනක්‍රමය තුළ වුවත් පාලකයන් මහජනතාවගේ තොරතුරු දැනගැනීමේ අයිතිය බන්දේසියක තබා පිළිගන්වන්නේ නැත. ඉල්ලීම් බලකිරීම් හා අවසානයේ උද්ඝෝෂණවලට පසුව විනා මහජනතාවගේ අයිතීන් දිනා ගන්නට හැකි වූ බවක් ලෝක ඉතිහාසයේ වාර්තාවන්නේ නැත. කම්කරු අයිතීන් දිනාගන්නට ලෝකය පුරා කම්කරුවෝ සටන් කළහ. පැය අටක වැඩකරන දිනයක් දිනාගත්තේ ජීවිත පරිත්‍යාගයෙනි. විශ්‍රාම වැටුප් සේවා වරප්‍රසාද අයිති කරගන්නට වැඩකරන ජනතාව මහත් කැපවීමක නිරතවූහ. තොරතුරු තාක්ෂණ යුගයේ දී එය එසේම විය යුතු නැත. එහෙත් ජනමාධ්‍ය හා සිවිල් සමාජය මෙම තොරතුරු දැනගැනීමේ නිදහස වෙනුවෙන් වගකීමක් ඇතිව මතවාදයක් ඇති කිරීමෙන් මූලික අරමුණ සාක්ෂාත් කරගත හැකිය.

පරිගණකය භාවිතාවට පැමිණීම සමග ජනජීවිතයේ කටයුතු පහසුවිය. අන්තර්ජාලය ගෝලීයකරණ සංකල්පය ප්‍රායෝගික එකක් කළේය. ලෝකයේ එක් කෙළවරක සිදුවන දේ ඉතාමත් ඉක්මනින් දැනගන්නට තොරතුරු තාක්ෂණය අනුව ඉඩ සැලසී ඇත. ඊ මේල්, වෙබ් අඩවි, බ්ලොග්, ෆේස් බුක් හා ට්විටර් වැනි සමාජ ක්‍රියාකාරකම් භූගෝලීය සීමා මායිම් නොතකමින් ඒ වෙනුවෙන් පහසුකම් සලසයි. තොරතුරු තාක්ෂණ යුගයේ දී ප්‍රජාතන්ත්‍රවාදය වඩාත් ප්‍රායෝගික මුහුණුවරක් ගෙන තිබේ. යම් කරුණක් ගැන එකම අදහස දරණ කණ්ඩායමක් ලෝකයේ විවිධ රටවලින් එකතු වී විශාල බලවේගයක් බවට පත්වන අතර එය අවසානයේ දී යුක්තිය හා සාධාරණත්වය පතා ආණ්ඩුවලට බලපෑම් කරන කණ්ඩායමක් බවට පත්වෙයි. වාරණය හා පාලනය එහි දී පහසු නැත. ඍජු ප්‍රජාතන්ත්‍රවාදය අනුව මහජනතාවට ද කෙලින්ම තමන්ගේ මතය දක්වන්නට තොරතුරු තාක්ෂණය අවස්ථාව උදා කරයි. මේ නිසා සිදුවන සමාජ ආර්ථික පරිවර්තනය සුවිශේෂීය.

මහජනතාවට තොරතුරු ධැනගැනීමේ අයිතිය තහවුරුකිරීම ප්‍රජාතන්ත්‍රවාදී රටක මූලික ලක්ෂණයකි. එහෙත් ප්‍රජාතන්ත්‍රවාදයත් එහි වගන්ති තිබූ පමණින් අයිතිවාසිකම් හිමිවන්නේ නැත. ඒ වෙනුවෙන් නව නීති රීති සම්පාදනය විය යුතුය. අලුත් ආකල්ප ඇතිව ක්‍රියා කළ

යුතුය. ජනමාධ්‍ය, බුද්ධිමතුන්, ජනමතප්‍රධානීන් හා සිවිල් සමාජය එය වෙනුවෙන් අවංකව පෙනී සිටිය යුතුය. තොරතුරු සම්පාදනයේ දී ජනමාධ්‍ය සුවිශේෂී කාර්ය භාරයක් ඉටු කරයි. 2003 වසරේ දී එක්සත් ජාතික පෙරමුණු රජය මාධ්‍ය කෙරෙහි බලපැවැත්වූ සාපරාධී අපහාස නීතිය ඉවත් කළේය. මේ වෙනුවට තොරතුරු ලබාගැනීමේ අයිතිය ඇතුලු අලුත් අදහස් ඇති පණත් ගණනාවක් යෝජනා කළේය. නමුත් එය පණතක් වශයෙන් පාර්ලිමේන්තුවට ඉදිරිපත්වූයේ නැත. තොරතුරු දැනගැනීමේ අයිතිය පාර්ලිමේන්තු පණතකින් සම්මත වී එය නීතියකින් තහවුරුකළ හැකි නම් වර්තමානයේ දී එය මහජනතාවගේ නිදහස හා අයිතිවාසිකම් සම්බන්ධයෙන් විශාල අවස්ථාවකි. වසර තිහක පමණ කාලයක් පැවති යුද්ධය නිසා ශ්‍රී ලංකාවේ අවධානය ත්‍රස්තවාදයෙන් මිදීම වෙනුවෙන් පමණක් කොටුවිය. ජාත්‍යන්තර සමාජය මානව හිතවාදය වෙනුවෙන් විවිධ නව පරිවර්තනයන් කරා ප්‍රවේශ වූ නමුත් මෙරටට එම අදහස් කාන්දු වූයේ නැත. යුද්ධය හමාර වී අලුත් අවකාශයක් නිර්මාණයවී ඇති මෙම මොහොත මහජනතාවගේ අයිතිවාසිකම් හා යුතුකම් සම්බන්ධයෙන් නැවුම් බලාපොරොත්තු ඇති කළ හැකි වකවානුවකි.

තොරතුරු යනු මොනවාද? මේ තොරතුරු මහජනතාව අතට පත් නොවන්නේ ඇයි? යන ප්‍රශ්නය ද ගැඹුරින් සාකච්ඡා කළ යුතුය.

මහජන නියෝජිතයන්ගෙන් සමන්විත පාලකයා ආණ්ඩුවයි. ප්‍රජාතන්ත්‍රවාදය අනුව මහජනතාව හා මහජන නියෝජිතයන් අතර ක්‍රියා පටිපාටියේ විනිවිදභාවයක් තිබිය යුතුය. බලය ආරක්ෂා කරගැනීම ඉදිරියේ නිලධාරීන්, රජය හා මහජනතාව අතර පරතරයක් නිරායාසයෙන්ම ඇතිවෙයි. මහජනතාවට රජයේ තොරතුරු ගලායාම මේ නිසා අවහිර වෙයි. රජය තොරතුරු සැපයීමෙන් ඈත්වන විට මහජනතාව තොරතුරු උපකල්පනය කරන්නට පටන් ගනී. ඕපාදූප හා පදනම් විරහිත කරුණු තොරතුරු ලෙස පොදු ජනතාව අතට පත් වෙයි. නිලධාරීන් හෝ රජයේ බලධාරීන් තොරතුරු සඟවන්නේ තොරතුරු හෙළිවීම තමන්ට අවාසිදායක යැයි විශ්වාස කරන නිසාය. එපමණක් නොවේ. තීරණ හා ක්‍රියාපටිපාටිය දැන ගැනීමෙන් තමන්ගේ බලය පවත්වාගෙන යාමට බලපෑමක් එල්ලවෙතැයි බලධාරීහු සිතති.

එපමණක් නොවේ. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක ආණ්ඩු පක්ෂය හා විපක්ෂය ද සිටී. ආණ්ඩුව යම් තීරණයක් ගන්නා විට අවාසිදායක තොරතුරු හෙළිකරන ලෙස විරුද්ධ මත දරන පිරිස් බලකරයි. දූෂණ වංචා බව කියමින් චෝදනා කරයි. මේ නිසා ඇතිවන්නේ විශාල ඝෝෂාවකි. ඇත්ත කුමක්ද? සිදුවන්නේ කවරක්ද යන්න වටහාගත නොහැකිවෙයි. ආණ්ඩු උත්සාහ කරන්නේ මහජන යහපත වෙනුවෙන් ක්‍රියාකරන්නටය. මේ රටේ කිසිදු ආණ්ඩුවක් රට විනාශ කරන්නට හෝ පාවා දෙන්නට ක්‍රියා කරන්නේ නැත. එහෙත් විපක්ෂය තමන්ට බලය ලබාගන්නට මෙවලමක් වශයෙන් මෙවැනි මත පතුරවයි. එය විපක්ෂයක ස්වභාවයයි. විනිවිද භාවයකින් යුතුව තොරතුරු සම්පාදනය මෙම අවදානමෙන් මිදෙන්නට විශාල කාර්යය භාරයක් ඉටු කරනු ඇත. එය කළ හැක්කේ මහජනතාවට තොරතුරු දැනගැනීමට ඇති අයිතිය නීතියෙන් තහවුරු කිරීමෙනි.

තමන් ගෙවන බදු මුදල් වැය කරන්නේ කෙසේ ද යන්න දැන ගැනීමට අයිතියක් ආණ්ඩුවට බදු ගෙවන ජනතාවට ඇත. එය පිළිගත යුතුය. මහජන මුදලින් ක්‍රියාත්මක වන ව්‍යාපෘතියක වියදම් හා කොන්ත්‍රාත්කරුවන්ගේ පසුබිම දැනගැනීමට ඉඩ ලැබීම දූෂණ වංචා අවම කිරීමට හේතුවකි. තමන්ගේ දරුවා පාසලට ඇතුලත් කර ගැනීම ප්‍රතික්ෂේප කර ඇත්නම් පාසලට ඇතුලත්කර ගෙන ඇති දරුවන් කවුරුන්ද ඔවුන්ට නිසි සුදුසුකම් තිබේද යන්න දැන ගැනීමට දෙමාපියන්ට අයිතියක් ඇත. දැන් එය කරන්නේ නිර්නාමික පෙත්සම් යැවීමෙනි. අධිකරණයේ නඩු පැවරීමෙනි. අධිකරණයේ නඩු පැවරීමෙන් තමන්ට අසාධාරණයක් වූ බව පෙන්වන්නට අවශ්‍ය කරුණු සොයාගත හැක්කේ කෙසේද? එය කළ නොහැක්කි. තොරතුරු දැන ගැනීමට ඇති අයිතිය නීතියෙන් තහවුරු කර ඇත්නම් අසාධාරණයක් වූ බව සිතන දෙමව්පියෙකුට පාසලට දරුවන් ඇතුලත්කළ පිළිවෙල විදුහල්පතිගෙන් ප්‍රශ්න කළ හැකිය. නිශ්චිත කාලයක් ඇතුලත එය ප්‍රසිද්ධ කළ යුතුවෙයි. දේශපාලන බලපෑමෙන් හෝ මුදලට යටවී අසාධාරණයක් වී ඇතැයි එයින් අනාවරණය කරගත හැකිවුවහොත් එයට විරුද්ධව ගතහැකි පියවර තිබේ.

ජනප්‍රිය පාසල්වලට දරුවන් ඇතුලත්කර ගැනීම සෑම වසරකම බරපතල ප්‍රශ්නයක් වන අතර දැන් පවතින ක්‍රමය අනුව කිසිවෙකු තම දරුවා ඇතුලත්කර ගැනීම හෝ ප්‍රතික්ෂේපවීම ගැන යුක්තිසහගත තොරතුරු දන්නේනැත. මේ නිසාම අසත්‍ය හා දෝෂාරෝපණ පැතිරයයි.

ටෙන්ඩර් කැඳවීම් හා ටෙන්ඩර් තීන්දුගැනීම් සම්බන්ධයෙන් රජයට අනේක විට චෝදනා එල්ලවෙයි. ටෙන්ඩරය දිනා ගන්නට අසමත්වන පුද්ගලයා සිතන්නේ එය තමන්ට නොලැබීම හරහා විශාල මුදල් වංචාවක් වී ඇති බවයි. ඉන්දියාව මේ වන විට ටෙන්ඩර් කැඳවීම පමණක් නොව ටෙන්ඩර් තීන්දු පවා අන්තර්ජාලයේ ප්‍රසිද්ධ කරයි. එම තොරතුරුවලට අනුව ටෙන්ඩර් පටිපාටිය සිදුවූයේ කෙසේද යන්න පැහැදිලිවෙයි. සේවාව අවශ්‍ය පුද්ගලයා හා සපයන්නා අතර ට අතරමැදියන් වැඩිවන තරමට දූෂණ වැඩිවන බව ප්‍රකට කාරණයකි. තොරතුරු විනිවිදව පෙනෙන අන්දමට සකස් කළහොත් අතරමැදියන්ට ඉඩ කඩ අහිමි වෙයි. එපමණක් නොවේ මේ වන විට මෙරට නිලධාරීන් දූෂණ වංචා චෝදනා නිසා රාජ්‍ය සේවාව අකර්මන්‍යවී තිබේ. නිලධාරීන් තමන්ට චෝදනා එල්ල වෙතැයි බියෙන් තීන්දු ගැනීමෙන් වැලකී සිටී. එම තත්ත්වයට විකල්පයක් විය හැක්කේ ගන්නා තීන්දුව විවෘතව ජනතාවට ඉදිරිපත් කිරීමෙන් පමණකි. මෙය අලුත් අත්දැකීමක් බැවින් නිලධාරීන් මෙන්ම ප්‍රතිපත්ති සම්පාදකයන් එයට වහා ඉදිරිපත් නොවිය හැකිය. එයට අවශ්‍ය නෛතික පසුබිම සකස් කළ හැක්කේ තොරතුරු දැනගැනීමේ අයිතිය පණතක් මගින් සම්මත කිරීමෙන් පමණකි.

ආණ්ඩුවල ක්‍රියාකාරීත්වය නිතරම විපක්ෂයේ විවේචන හා දෝෂදර්ශනය ලක්වෙයි. එවිට මාධ්‍ය මගින් ද ලැබෙන්නේ පුලුල් ප්‍රචාරයකි. මැතිවරණයකි දී මෙය බහුලව සිදුවෙයි. ආණ්ඩුවේ වැරදි හා දූෂණ පෙන්වා දෙන විපක්ෂය මහජනතාවගේ හිතදිනා ගනී. දූෂණය ආණ්ඩු බලයට පත්කරන ජනප්‍රිය සටන් පාඨයකි. නමුත් අලුත් ආණ්ඩුව එන විට පැරණි වැරදි අමතක කරයි. බලයෙන් පහවී විපක්ෂයට යන පාලක පිරිස දැන් විපක්ෂයේ සිට ආණ්ඩුවේ වැරදි සොයන්නට පටන්ගනී. සත්‍ය, අසත්‍ය හා දූෂමාණ ආරංචි පතුරවා ආණ්ඩුව අසාර්ථක බව පෙන්වීම හැම විපක්ෂයකම උත්සාහයයි. නිදහස ලැබූ දා පටන් ම රටට ඇත්තේ එවැනි අවාසනාවන්ත තත්ත්වයකි. රාජ්‍ය ව්‍යවසාය විනාශ කළ බවට අවුරුදු හැටක් තිස්සේ ආණ්ඩු චෝදනා ලබයි. ඒ චෝදනාව කරන විපක්ෂය පසුව ආණ්ඩු බලය ලබා ගත් අවස්ථාවේ ආණ්ඩුවෙන් විපක්ෂයට යන මැති ඇමතිවරු තමන්ට යළි බලය ගන්නට පාවිච්චි කරන්නේ ද එම චෝදනාවමය. දූෂණ, වංචා හෝ අක්‍රමිකතා ගැන නිවැරදිව මහජනතාවට කරුණු දැන ගැනීමට අයිතියක් ඇත්නම් මේ අන්දමට ප්‍රජාතන්ත්‍රවාදය අයුතුලෙස ප්‍රයෝජනයට ගන්නට කිසිවෙකුට ඉඩ නොලැබේ.

ජනමාධ්‍යයන්ට මෙය විශාල අවස්ථාවකි. මාධ්‍යවේදීන් රජයේ ආයතනයක තොරතුරු ඉල්ලා සිටි විට කිසිදු නිලධාරියෙකු ඒවා පහසුවෙන් නිකුත්කරන්නේ නැත. තොරතුර අනාවරණයවීමෙන් යහපතක් නොවන බව සිතන අතර එයින් සිදුවන්නේ වෘත්තීය සමිති හෝ කඩාකප්පල්කාරීන් හරහා මාධ්‍යවේදීන් අතට පත්වන අතිශයෝක්තියෙන් යුතු තොරතුරු මාධ්‍යයේ පළවීමයි. මේනිසා සිදුවන හානිය ඇත්ත දැනගැනීමට ඉඩදීමට සාපේක්ෂව ඉතා බරපතල එකකි.

ඉන්දියාව තොරතුරු ධෑන ගැනීමේ අයිතිය නීතියෙන් තහවුරු කර තිබේ. ආසියාවේ දියුණු ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ උපයාගෙන ඇති රටක් වශයෙන් ඉන්දියාවේ මහජනතාව නොයෙකුත් ක්ෂේත්‍ර ඔස්සේ රජයට සම්බන්ධ තොරතුරු ලබාගන්නට මෙම නීතියේ ආවරණය මහජනතාවට දී ඇත. රජයේ ක්‍රියාකාරීත්වය හා විනිවිද භාවය පිළිබඳව ප්‍රශ්න ඇති අවස්ථාවේ දී ඇත්ත කුමක් ද යන්න ඍජුව විමසන්නට එරට වැසියන්ට අයිතිය හිමිවී තිබේ. ශ්‍රී ලංකාව එම පරිසරය අධ්‍යයනය කර එහි වැදගතකම අවබෝධ කරගත යුතුය.

තොරතුරු දැනගැනීමේ අයිතිය සඳහා නව නීති සම්පාදනයට අවශ්‍ය දළ කෙටුම්පතක් ද ශ්‍රී ලංකා ජාතික සංගමය විසින් පසුගිය මහ මැතිවරණය සමයේ  සකස් කරන ලදී. විද්වතුන්, ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදීන් හා නිලධාරීන් එක්ව සකස් කළ එය ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත්කරන නව ප්‍රවේශයක් වශයෙන් භාවිතාවට ගත යුතුය. නව පණත අනුව සෑම රජයේ ආයතනයකම

තොරතුරු නිලධාරියෙකු පත්කළ හැකිය. මහජනතාව තොරතුරු ඉල්ලා සිටින විට නිශ්චිත කාලසීමාවක් ඇතුලත නිවැරදි දත්ත ඉදිරිපත් කිරීමට එම නිලධාරියා නීතියෙන් බැඳී සිටියි. එසේ කරන්නට අපොහොසත් වුවහොත් ඔහුගේ හෝ ඇයට එරෙහිව පෞද්ගලිකව නීතිමය ක්‍රියාමාර්ග ගන්නටත් වැටුපින් දඩ අයකරන්නටත්, තොරතුරු ඉල්ලා සිටින පුද්ගලයා තවදුරටත් අතෘප්තිමත් නම් ශ්‍රේෂ්ඨාධිකරණයට යන්නට ද නීතිමය ප්‍රතිපාදන සලසා ඇත.

මෙම ප්‍රජාතන්ත්‍රවාදයට වැදගත් ආකෘතිය ක්‍රියාවට නංවන්නට අවශ්‍යව ඇත්තේ රජයේ හා විපක්ෂයේ උනන්දුව පමණකි. තොරතුරු දැනගැනීමේ අයිතිය නීතියෙන් තහවුරු කළ හැකිනම් මේ කතාකරන දූෂණ වංචා හෝ අක්‍රමිකතා ගැන මහජනතාවට ඇත්ත ධෑන ගන්නටත්, පටු දේශපාලන වාසි තකා අනවශ්‍ය චෝදනා හා මඩ ගැසීම් වලට ඉඩ නැතිවන බවත් අමතක කළයුතු නැත.

එහෙත් රටට අහිතකර තැනෙකදී මෙම අයිතිය මෙයට හාත්පසින්ම වෙනස්ය. ජාතික ආරක්ෂාව, ආයෝජන හෝ මහජන අයහපතට හේතුවන රහසිගත තොරතුරු අනාවරණය කිරීම මෙම නීතියට අනුකූලනොවන බවට පණත හඳුන්වා දෙනවිටම තීරණය කළ හැකිය. නීතිය අනුව මහජනතාව ගෙවන බදු ගැන ප්‍රශ්න කරන්නට අවස්ථාව හිමිවන නිසා අනිවාර්යයෙන්ම විනිවිද භාවයක් ඇතිවී ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත්වෙයි.

ගැටුම් නිමාවීම සාමකාමී පරිසරයක් උදාවීම සමග දේශපාලන පක්ෂ හා සංවිධාන මැතිවරණ පැවැත්වීම ගැන උනන්දුවන වකවානුවක් උදාවී තිබේ. මහජනතාවට හා ඔවුන්ගේ බුද්ධියට ගරු කළ යුතු යුගය දැන් උදා වී තිබේ. ප්‍රජාතන්ත්‍රවාදය දියුණු වී මහජනතාවට දැනුම අවබෝධය ලැබෙන්නේ එවිටය. තොරතුරු සපයා මහජනතාවට තීන්දු ගන්නට ඉඩ දෙන යුගයක් විනා යළි යළිත් පොරොන්දු දෙමින් මහජනතාව යුගයෙන් යුගයට අන්ධකාරය කරා කැඳවාගෙන යාමේ දේශපාලනය අවසන් කිරීම අවශ්‍යතාවයයි.

**මිලින්ද මොරගොඩ**